# සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය

**විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය**

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය

වාරය : දෙවන වාරය

ඒකකය - ක්‍රියා පද හා එහි ප්‍රභේද

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.2 ක්‍රියා පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදේ.

අරමුණු

- වචන ,පුරුෂ, ලිංග හා කාල වශයෙන් ක්‍රියා පද වර්ග කරයි.
- ක්‍රියා පදවල වචන භේදය, පුරුෂ භේදය,ලිංග භේදය, කාල භේදය හඳුනාගෙන ලියයි.
- ප්‍රායෝගික භාෂා කාර්යයේ දී ක්‍රියා පද පිළිබඳ දැනුම  නිවැරදි ව භාවිත කරයි.

**1. හිස්තැනට ගැළපෙන වචනය කොටුව තුළින් තෝරා යොදන්න.**

I භාෂාව මාර්ගයෙන් අදහස් ප්‍රකාශ කරනුයේ අරුත් සහිත ඒකක වන ……….. මාර්ගයෙනි.කතාවේදී අරුත් පළ කෙරෙනුයේ ……….. සෑදුනු පද භාවිතයෙනි. සිංහලයේ පද වර්ග ……….. කි. එනම් ……….. ක්‍රියා පද හා නිපාත පදයි ……….. යනු යම්කිසි කිරීමක් සිදු වීමක් හෝ විදීමක් ගැන කියවෙන පදයි.

ක්‍රියා පදයක් | ශබ්දවලින් | පද | තුනකි | නාම පද

**2. පහත දැක්වෙන ක්‍රියා පද ඒක වචන හා බහු වචන ලෙස වගුගත කරන්න.**

**(නටයි, කළහ, බැලුවෝ ය, කරමි, බැලුවෙහි, ගියේ ය, කරමු, ලිව්වෙහු, උගන්වයි, ගියහ)**

| ඒක වචන | බහු වචන |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

**3. පහත දැක්වෙන වාක්‍යවලට ගැළපෙන අතීත කාල ක්‍රියා පදය තෝරන්න.**

I නංගී සෙල්ලම් ____________

II අම්මා බත් ____________

III තාත්තා වැඩට ____________

IV උපාසිකාව පන්සල් ____________

V අපි සතුටින් සෙල්ලම් ____________

ගියා ය | කළෙමු | ගියේ ය | කළා ය | පිසුවා ය

**4. පහත දැක්වෙන වාක්‍යවලට ගැළපෙන වර්තමාන කාල ක්‍රියා පදය තෝරන්න.**

I අපි කඩපොළට ________ **(යමු/යන්නෙමු)**

II තාත්තා වැඩට ________ **(ගියේ ය/ යයි)**

III කාන්තාවෝ ශ්‍රමදානයට සහභාගී ________ **(වෙති/වෙයි)**

IV විදුහල්පතිතුමා ශිෂ්‍යයන් ________ **(ඇමතුවේ ය/ අමතයි)**

V ළමයි උදෑසන බුදුන් ________ **(වඳිති/වැන්දෝ ය)**

**5. පහත සඳහන් වාක්‍යවල ලිංග භේදයට අනුව ආඛ්‍යාතය යොදන්න.**

I රාජ කුමාරයා සටන් බිමට ________ **(ගියේ ය/ගියා ය)**

II සේවිකාව සිංදුවක් ________ **(කිව්වා ය/කිව්වේ ය)**

III ගොවියා නියර සකස් ________ **(කළේ ය/කළා ය)**

IV ලේඛිකාවෝ වාර්තාව ________ **(ලිව්වේ ය/ලිව්වෝ ය)**

V විදුහල්පතිතුමා ශිෂ්‍යයන් ________ **(ඇමතුවේ ය/ඇමතුවා ය)**

## ක්‍රියා පද හා එහි ප්‍රභේද

### පිළිතුරු පත්‍රය

**1.**

I. පද
II. ශබ්දවලින්
III. තුනකි
IV. නාම පද
V. ක්‍රියා පදයක්

**2.**

| ඒක වචන | බහු වචන |
|---|---|
| නටයි | කළහ |
| කරමි | බැලුවෝ ය |
| ගියේ ය | කරමු |
| උගන්වයි | ලිව්වෙහු |
| බැලුවෙහි | ගියහ |

**3.**

I. කළා ය
II. පිසුවා ය
III. ගියේ ය
IV. ගියා ය
V. කළෙමු

**4.**

I. **යමු**
II. **යයි**
III. **වෙති**
IV. **අමතයි**
V. **වදිති**

**5.**

I. **ගියේ ය**
II. **කිව්වා ය**
III. **කළේ ය**
IV. **ලිව්වෝ ය**
V. **ඇමතුවේ ය**